# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/51 - 2017 පෙබරවාරි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

නියෝග අංකය :- 33

විශේෂ්‍ය අංකය :- ක/14

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

22(1)(ඊ) වගන්තිය යටතේ වූ නියමය

1975 අංක 39, 1981 අංක 14, 1981 අංක 39, 1986 අංක 14, 1986 අංක 18 දරන පනත් වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මේ නියමය මගින් :-

(අ) මේ නියමයේ උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන කෘෂිකාර්මික ඉඩම් මේ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ ස්වකීය නම් නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් වෙත පැවරිය යුතු බවටත් ;

(ආ) මේ නියමයේ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දැක්වෙන කෘෂිකාර්මික ඉඩම් මේ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ ස්වකීය නම් නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ට අයත්ව තිබූ බවත් එකී කෘෂිකාර්මික ඉඩම් එකී තැනැත්තන් සාමාජිකයන් වන පවුලේ ප්‍රධානියාට අයත් බවට සලකනු ලැබූ ඉඩම් ප්‍රමාණයට ඇතුළත් කරනු ලැබූ බවටත් ;

(ඇ) ඉහත කී පනත ප්‍රකාරව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ සීමාව පනවනු ලැබූ අවස්ථාවේ දී මේ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ නම් සඳහන් තැනැත්තන් වයස අවු. 18 ට අඩු තැනැත්තන් වූ බවටත් ;

(ඈ) මේ නියමයේ උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව සඳහන් කෘෂිකාර්මික ඉඩම් ඉහත කී පනතේ 22 වගන්තිය යටතේ කිසිම තැනැත්තෙකුට පවරනු නොලැබූ බවටත් ; සහ

(ඉ) ඉහත කී කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 28 වැනි වගන්තිය යටතේ කිසිම වන්දි ගෙවීමක් සිදුකර නැති බවටත් ;

මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A - G 25049 — 13 (2017/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| නිකදළුපොත වැලිවිට වත්ත ලිපිනයේ පදිංචි ලූයි දීසාල හේමන්ත පීරිස්<br><br>බත්තරමුල්ල ශ්‍රී සුභූතිපුර රම්‍යා මාවත අංක 42 හි පදිංචි ඉශිටා කුමාරි මෙන්ඩිස් | වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාසයේ මහගල්බොඩ මෙගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ උඩුගොඩගම ගමේ පිහිටි උතුරට :- අ.ග.පි. 1324 අතිරේක අංක 4 හි කැබලි අංක 2 ද නැගෙනහිරට :- කැබලි අංක $O^{987}$ හා $N^{987A}$ ද දකුණට :- වේගොල්ල ගම හා කටුකෙන්ද ඇලද බස්නාහිරට :- කටුකෙන්ද ඇලද මායිම් වූ සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 1324 හි අතිරේක අංක 4 හි කැබලි අංක 3 වශයෙන් දැක්වෙන වැලිවිට වත්ත නැමති ඉඩමේ අක්. 31 රූඩ්. 1 පර්. 33 ක ප්‍රමාණය හා ඉඩම් තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ද, |
| | වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාසයේ මහගල්බොඩ මෙගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ උඩුගොඩගම ගමේ පිහිටි උතුරට :- අ.ග.පි. 1337 හි පඹේගම ද නැගෙනහිරට : අ.ග.පි. 1323 නම්බිගම හා අ.ග.පි. 1322 මොරණෑගමද දකුණට :- කැබලි අංක $L^{987}$c ද බටහිරට : ගම්සභා පාර ද මායිම් වූ සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 1324 හි අතිරේක අංක 4 හි කැබලි අංක 4 වශයෙන් දැක්වෙන වැලිවිට වත්ත නැමති ඉඩමේ අක්. 06 රූඩ්. 0 පර්. 35 ක ප්‍රමාණය හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලිද. |
| | වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ආදායම නිළධාරී කොට්ඨාසයේ මහගල්බොඩ එගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ දෙවැද්දගමේ පිහිටි උතුරට : කටුකෙන්ද ඇල හා වැගොල්ල ගමද, නැගෙනහිරට : කැබලි අංක $T^{980B}$ ද දකුණට :- කැබලි අංක $T^{980D}$ ද බස්නාහිරට :- මු.පි. 2277 හි කැබලි අංක $P^{1155}$ සහ මු.පි. 2273 හි කැබලි අංක $W^{1153}$ වද, මායිම් වූ සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 1326 හි අතිරේක අංක 3 හි කැබලි අංක 4 වශයෙන් දැක්වෙන වැලිවිට වත්තේ අක්. 10 රූඩ්. 1 පර්. 00 ක ප්‍රමාණය ඇති ඉඩම් කොටස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. |

02 - 686

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.